# කෘෂි තාක්ෂණ තොරතුරු

කෘෂි තාක්ෂණ තොරතුරු කඩිනමින් ගොවි ජනතාව අතරට ලබා දීමේ අත්වැලකි

*කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේ ප්‍රකාශනයකි*

**තාක්ෂණික පත්‍රිකා අංක 4 - 2014 පෙබරවාරි**


## 2003 අංක 22 දරණ බීජ පනත හා නව බීජ හා රෝපණ ද්‍රව්‍ය පනත් කෙටුම්පත

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් 2003 අංක 22 දරණ බීජ පනත පරිච්ජින්න කර (Repeal) නව පනතක් සඳහා කෙටුම්පත් යොජනාවලියක් ඉදිරිපත් කර තිබේ. මෙය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය මඟින් ප්‍රසිද්ධ කර ඒ සඳහා මහජන අදහස් විමසා ඇත. ඒ අනුව විවිධ ප්‍රතිචාර හා අර්ථකතන ලැබෙමින් පවතින අතර එයට අදාළ පැහැදිලි කිරීම් හෝ ඉදිරියේදී සිදුකිරීමට යෝජිත සංශෝධන හා දැනට ක්‍රියාත්මක වන 2003 අංක 22 දරණ බීජ පනත පිළිබඳ තාක්ෂණික කරුණු මෙයින් ඉදිරිපත් කර ඇත.

### 2003 අංක 22 දරණ බීජ පනත

**2003 අංක 22 දරණ බීජ පනත ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය මතුවීමට හේතුව කුමක්ද?**

දේශිය ආහාර බෝගයන්ගේ බීජ නිෂ්පාදනය හා ආනයනය 1980 දශකය වනතෙක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ පැවතුනි. එහෙත් බීජ ආනයන කිරීමේ පූර්ණ වගකීම 1984 වර්ෂයේ සිට පුද්ගලික අංශය වෙත පවරා දෙන ලදි. තවද, දේශීයව වැඩි දියුණු කළ ප්‍රභේදයන්ගේ බීජ නිෂ්පාදනය පුද්ගලික අංශය මගින් 1990 වර්ෂයේ සිට ආරම්භ කරන ලදි. ඒ අනුව විවිධ පාර්ශවයන් බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනයට සම්බන්ධ වු බැවින්, ඒවායේ ගුණාත්මය ආරක්ෂා කිරීම සඳහා ජාතික බීජ ප්‍රතිපත්තියක් 1996 වර්ෂයේදී ඉදිරිපත් කර ඇත. එහෙත් ප්‍රමිතියෙන් තොර බීජ හා රෝපණ ද්‍රව්‍ය වෙළඳපලේ සංසරණය වීම, ප්‍රමිතීන් හඳුනාගත නොහැකි වීම, රෝග, පලිබෝධ හා වල් පැළෑටි බීජ, අලෙවි කරනු ලබන බීජ හා රෝපණ ද්‍රව්‍ය සමඟ ව්‍යාප්ත වීම, කල් ඉකුත් වු බීජ හා රෝපණ ද්‍රව්‍ය විකිණීම, ප්‍රමිතියෙන් තොර ඇසුරුම් භාවිතය, නීත්‍යානුකූල නොවන මාර්ග වලින් ගෙනෙන ලද විදේශීය බීජ වෙළඳපල වෙත ඉදිරිපත් කිරීම වැනි කරුණු මඟින් දේශීය ගොවීන් අපහසුතාවයට පත්වීම, ඔවුන්ගේ වගාවන්ගේ අස්වැන්නේ ගුණාත්මය හා ප්‍රමාණය පහල යෑම වැනි කරුණු වැළැක්වීම පිණිස නීතිමය ආවරණයක් නොවූ බැවින් 2003 බීජ පනත ඉදිරිපත් කර ඇත.

**සාක් (SAARC) කලාපයේ බීජ පනතක් මුලින්ම ක්‍රියාත්මක කලේ අප රටද ?**

සාක් රටවල බීජ පනත් පරීක්ෂා කිරීමේදී ඉන්දියාව 1966 වර්ෂයේද, පකිස්ථානය හා බංගලාදේශය පිලිවෙලින් 1976 හා 1977 වර්ෂ වලදී ද බීජ පනත් ඉදිරිපත් කර ඇත. ඉතිරි සාක් කලාපයේ රටවල් හා සැසඳීමේදී, ඇෆ්ගනිස්ථානය (2006) හැර ඉතිරි සියලුම රටවල් ශ්‍රී ලංකාවට පෙර (2003) බීජ පනත් ක්‍රියාත්මක කර තිබේ.

**2003 අංක 22 පනතේ සංක්ෂිප්තය කුමක්ද ?**

දේශිය වගාව සඳහා වාණිජ මට්ටමින් හුවමාරුවන බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා ආනයනය කරන විටදී සම්මත ප්‍රමිතින් අනුගමනය කිරීමටත්, නිෂ්පාදනය හා ආනයනය සිට අලෙවිය දක්වා වන විවිධ අවස්ථාවලදී ඒවායේ ගුණාත්මය තහවුරු වන පරිදි කටයුතු කරන ලෙස එම කාර්යයන්හි නිරතවන්නන්ට බල කෙරෙන හා ඔවුන්ගේ අයිතිවාසිකම් ද ආරක්ෂා කරනු ලබන නිතිමය ක්‍රියාදාමයකි. ඒ අනුව බීජ හා රෝපණ ද්‍රව්‍ය වල ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම, බීජ හා රෝපණ ද්‍රව්‍ය භාවිතාකරන්නන් (වගා කරන ගොවීන්) සහ බීජ හසුරුවන්නන්ගේ (බීජ නිෂ්පාදකයන්, බීජ ආනයනකරුවන්, බීජ අපනයනකරුවන්, බීජ සකස් කරන්නන්, බීජ ගබඩාකරුවන්, බීජ ඇසුරුම්කරුවන්, බීජ බෙදාහරින්නන්, තොග හා සිල්ලර බීජ අලෙවිකරුවන්, සමාගම් නියෝජිතයන් ඇතුළු බීජ කර්මාන්තයට අදාළ සියළුම පාර්ශවයන්) අයිතීන් ආරක්ෂා කිරීම මෙම පනතේ මුලික අරමුණ වී තිබේ.

**2003 අංක 22 බීජ පනතේ අන්තර්ගතය ඉදිරිපත් කර ඇති ආකාරය කුමක්ද ?**

මෙම පනත කොටස් 7 ක් යටතේ ඉදිරිපත් කර තිබුණි.

I. පනත ක්‍රියාත්මක කිරීම (Administration of the Seed Act)
II. ජාතික බීජ සභාව පිහිටුවීම (Establishment of National Seed Council)
III. ලියාපදිංචි කිරීමේ කාර්ය පටිපාටිය (Registration Procedure)
IV. කාර්ය පටිපාටිය (Procedure)
V. බීජ සහතික කිරීමේ සේවාව (Seed Certification Service)
VI. අභියාචනා (Appeals)
VII. වැරදි හා දණ්ඩන (Offences & Penalties)

**2003 අංක 22 බීජ පනතේ සඳහන් මුලික කරුණු කවරේද?**

- පනතේ පරිපාලනය කටයුතු හා වාණිජ මට්ටමේ හුවමාරු වන (දේශීය /විදේශීය) බීජ හා රෝපණ ද්‍රව්‍ය වල ප්‍රමිතිය පිලිබඳ පූර්ණ වගකීම කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු වීම.
- පනත ක්‍රියාත්මක කිරීම, බලයලත් නිලධාරීන් මඟින් සිදු කිරීම.
- තාක්ෂණික කමිටුවක් ලෙස බීජ සභාවක් පිහිටුවීම.
- සියලුම බීජ හසුරුවන්නන් බීජ පනත යටතේ ලියාපදිංචි වීම අනිවාර්ය වීම හා ඔවුන් පනතට අනුකූලව කටයුතු කිරීමට නීතියෙන් බැඳී සිටීම.
- බීජ සහතික කිරීමේ සේවයේ සේවය ලබා ගැනීමෙන් බීජ හා රෝපණ ද්‍රව්‍ය සහතික කිරීම හෝ බීජ හසුරුවන්නන් විසින්ම බීජ හා රෝපණ ද්‍රව්‍ය වල ප්‍රමිතිකරණය සිදු කිරීමට අවස්ථාව ලබාදීම.

2003 අංක 22 දරණ බීජ පනත ක්‍රියාත්මක කිරිම සඳහා ව්‍යාප්ති කාරකයෙකුගේ වගකීම කුමක්ද ?

- බිජ පනතක් අවශ්‍ය වීමට හේතුව ගොවි ජනතාව හා බීජ හසුරුවන්නන් හට පහදා දීම.
- තම බල ප්‍රදේශයේ බීජ හසුරුවන්නන් බීජ පනත යටතේ ලියාපදිංචි කරවීම තුළින් ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය සුලභතාවය ඉහල නැංවීම.
- සදෝෂ බීජ පිලිබඳව විමසිල්ලෙන් සිටීම හා ඒ පිළිබඳව බීජ පනත ක්‍රියාත්මක කිරීමේ කාර්යාලය (දු.ක : 081-3755235) නොපමාව දැනුවත් කිරීම.
- විශ්වාසදායි හා ගුණාත්මය තහවුරු වු බීජ හා රෝපණ ද්‍රව්‍ය පමණක් මිලදී ගැනීමට ගොවි ජනතාව දැනුවත් කිරීම.
- සදෝෂ බීජ භාවිතයේදි ඇතිවිය හැකි ගැටළු පිළිබඳව ගොවි ජනතාව දැනුවත් කිරීම.
- තම කලාපයට අදාළව බීජ හැසිරවීමේ කටයුතු පිළිබඳව අවශ්‍ය නිසි උපදෙස් ලබාදීම.
- බීජ හසුරුවන්නන් විසින්ම ප්‍රමිතිකරණය කර ගැනීමට අවකාශ ලබාදී ඇති බැවින් ඒ සඳහා අවශ්‍ය සහයෝගය, සම්බන්ධීකරණය හා තාක්ෂණික උපදෙස් ලබාදීම.

## 2013 වර්ෂයේදි ඉදිරිපත් කර ඇති බීජ හා රෝපණ ද්‍රව්‍ය නව පනත් කෙටුම්පත් යෝජනාවලිය පිළිබඳ කරුණු පැහැදිලි කිරීම

මෙම යෝජනාවලිය මහජන අදහස් සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය වන www.agridept.lk හා රජයේ වෙබ් අඩවිය වන www.gov.lk හි ප්‍රසිද්ධ කර ඇත. ඒ සඳහා ප්‍රතිචාර/යෝජනා විවිධ මාධ්‍ය මඟින් ඉදිරිපත් වෙමින් පවති. එහෙත් මෙම යෝජනාවලිය බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය වාණිජ ව්‍යාපාරයක් නොවන විටදී, වෙනත් පුද්ගලයෙකු හට වැපිරීම හෝ රෝපණය කිරීම සඳහා සම්ප්‍රදායිකව හුවමාරු කරගත් හෝ ගණුදෙනු කරන හෝ එම හසුරුවන්නාට සෘජුවම භාරදෙනු ලබන බීජ හා රෝපණ ද්‍රව්‍ය සඳහා අදාළ නොවන බැවින් සම්ප්‍රදානුකූල බීජ හැසිරවීමේ කටයුතු පෙර මෙන්ම ක්‍රියාත්මක කළ හැකි වේ.

### පවතින 2003 අංක 22 දරණ පනත සංශෝධනය නොකර පරිච්ඡින්න කර (Repeal) නව බීජ පනතක් සඳහා කෙටුම්පත් යෝජනාවලියක් ඉදිරිපත් කිරීමට අවශ්‍යතාවය කුමක්ද?

බීජ හා රෝපණ ද්‍රව්‍ය වල ගුණාත්මකභාවය විධිමත් කිරීම සඳහා හා ඊට සම්බන්ධ හෝ ආනුෂාංගික කරුණු සඳහා විධාන සැලැස්වීමට ඉදිරිපත් කළ 2003 අංක 22 දරණ බීජ පනත මඟින් පනවන ලද නීතිමය විධිවිධානයන්ට දැනට දශකයකට වඩා ගත වී ඇත. ඒ අනුව වර්තමාන නීතිමය අවශ්‍යතාවයන්ට හා සංවර්ධනය වෙමින් පවතින බීජ කර්මාන්තයට හිතකර වන සේ පනත පුළුල් ලෙස වෙනස්කම් වලට ලක්කිරීම, කාලීන අවශ්‍යතාවයක් වී ඇත. එහෙත් දැනට පවතින පනත සංශෝධනය කළද, වර්තමාන ප්‍රායෝගික අවශ්‍යතා සපුරා ගැනීම අසීරු කටයුත්තක් මෙන්ම සංකීර්ණ නීතිමය ප්‍රතිපාදන සමඟ පරස්පරතා මතුවිය හැකිය. ඒ බැවින් මෙම පනත සංශෝධන නොකර වර්තමාන කෘෂිකාර්මික සංවර්ධන ක්‍රියාදාමයට ගැලපෙන අයුරින් හා "මහින්ද චින්තන ඉදිරිදැක්ම" යටතේ දක්වා ඇති පරිදි රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුකූල වන පරිද්දෙන් පවත්නා නීතිමය රාමුවෙහි ඇති අඩුලුහුඩුකම්, රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුකූල වන පරිදි පුළුල් වෙනස්කම් වලට ලක් කිරීම අවශ්‍ය වී ඇත. ඒ අනුව, පවතින අඩුලුහුඩුකම් සම්පූර්ණ කර, වර්තමාන නෛතික අවශ්‍යතා සම්පූර්ණ වනසේ බීජ හා රෝපණ ද්‍රව්‍ය ක්ෂේත්‍රයට අදාළ නිලධාරීන්, බීජ හසුරුවන්නන්, බීජ භාවිතා කරන්නන් ඇතුළු සියළු පාර්ශවයන් ගේ අදහස් හා යෝජනා සැලකිල්ලට ගෙන එකී පාර්ශවයන්ගේ ද සහභාගිත්වයෙන් පවත්වන ලද වැඩමුළු ගණනාවක ප්‍රතිඵල පාදක කරගෙන නව බීජ පනතක් සඳහා වූ යෝජනාවලියක් ලෙස පිලියෙල කර ඉදිරිපත් කර ඇත.

එමඟින්, බීජ හා රෝපණ ද්‍රව්‍ය වල ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම හා නියාමනය කිරීම, බීජ හා රෝපණ ද්‍රව්‍ය භාවිත කරන්නන් ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා හසුරුවන්නන් ගේ ක්‍රියාකාරකම් විධිමත් කිරීම හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, බීජ හා රෝපණ ද්‍රව්‍ය කර්මාන්තයේ සංවර්ධනය, කෘෂිකර්මාන්තයට වැදගත් වන්නා වූ දේශීය බීජ හා රෝපණ ද්‍රව්‍ය වල ජාන සම්පත් සුරක්ෂිත කිරීම හා සංරක්ෂණය සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීමට නියමිත අතර එය 2003 අංක 22 දරණ බීජ පනත පරිච්ඡින්න කිරීම පිණිස වූ නව පනතක් සඳහා යෝජනාවලියක් ලෙස ඉදිරිපත් කර ඇත.

### නව පනතක් ලෙස ඉදිරිපත් කිරීමේදී ඇතුළත් කර ඇති විශේෂ කරුණු හා එයට හේතු කවරේද ?

- වර්තමාන කෘෂිකර්මාන්ත සංවර්ධනයේ අවශ්‍යතාවය මත පුළුල් පරාසයක් ආවරණය වනසේ වර්තමානයේ ක්‍රියාත්මක පනතේ ඇති කොටස් 7 ක්, මෙම යෝජනාවලියේ දි කොටස් 12 ක් යටතේ ඉදිරිපත් කිරීම හා ඒවා වර්තමාන අවශ්‍යතාවයන්ට වඩාත් ගැලපීම.
- කෘෂිකාර්මික ක්ෂේත්‍රයට සම්බන්ධ විවිධ ආයතන මඟින් බීජ හා රෝපණ ද්‍රව්‍ය වලට අදාළව සිදුකරනු ලබන කාර්යයන්, හා බීජ හා රෝපණ ද්‍රව්‍ය හසුරුවන්නන්ගේ කාර්යයන් සම්බන්ධීකරණය කිරීම හා විධිමත් කිරීම සඳහා පනතේ කාර්යයන් සඳහාම නිසි බලයලත් රෙජිස්ට්‍රාර්වරයෙකු පත් කිරීම වඩා යෝග්‍ය වීම (4 වගන්තියේ 2 උප වගන්තිය).
- එකී රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යයන් සම්බන්ධීකරණය පහසු වීම සඳහා අදාළ අංශ වලින් සහකාර රෙජිස්ට්‍රාර්වරයෙකු බැගින් පත්කර ගැනීම අවශ්‍ය වීම (4 වගන්තියේ 3 උප වගන්තිය).
- දැනට පවත්නා පනත යටතේ පිහිටුවා ඇති ජාතික බීජ සභාවේ සංයුතිය වෙනස්කොට ජාතික බීජ හා රෝපණ ද්‍රව්‍ය උපදේශන සභාවක් පිහිටුවීම (6 වගන්තියේ 1 උප වගන්තිය). එමඟින් බීජ කර්මාන්තයේ සංවර්ධනයට අවශ්‍ය වන ප්‍රතිපත්තිමය තීරණ ගැනීම වඩා පහසු වනු ඇත.

- රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යය පහසුවීම සඳහා හා ඔහුට උපදෙස් ලබාදීම සඳහා බීජ හා රෝපණ ද්‍රව්‍ය ක්ෂේත්‍රයට අදාළ විද්‍යාඥයින්ගෙන් සැදුම්ලත් තාක්ෂණික හා උපදේශක කමිටුවක් පත් කිරීම මඟින් තාක්ෂණික කරුණු සඳහා තීරණ ගැනීම පහසු කර ගැනීම (5 වගන්තියේ 1 උප වගන්තිය).
- පනත යටතේ පවරනු ලබන කාර්යයන් ඉටු කිරීම සඳහා පමණක් අපරාධ නඩු විධි විධාන සංග්‍රහය යටතේ පොලිස් නිලධාරියෙකු වෙත පැවරී ඇති බලතල කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අදාළ නිළධාරීන් වෙත ලබා දීම තුළින් වංචනික බීජ හසුරුවන්නන් පිළිබඳව පරීක්ෂා කිරීම පහසු වීම (4 වන වගන්තියේ 6 වන උප වගන්තිය).
- වාණිජමය අරමුණක් තුළ බීජ හා රෝපණ ද්‍රව්‍ය හසුරුවන්නන් සඳහා විධිමත් හා කාර්යක්ෂම ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම අවශ්‍ය වීම (11 වන වගන්තිය).
- බීජ කර්මාන්තයට අදාළ පැමිණිලි පරීක්ෂා කිරීමට හා විශේෂ අවස්ථා වලදී අවශ්‍ය පරීක්ෂා කිරීමේ කාර්යයන් සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දීම, එය කාලීනව වැදගත්ය. (13 වන වගන්තිය).
- බීජ කර්මාන්තයට අදාළ ආනයන, අපනයන, ප්‍රති අපනයන ආදිය සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දීම අවශ්‍ය වීම (15 වන වගන්තිය).
- කෘෂිකර්මාන්තයට වැදගත් වන දේශීය පාරම්පරික ජාන සම්පත් ආරක්ෂා කර ගැනීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දීම තුළින් එම සම්පත් මතු පරපුරට සංරක්ෂණය කර තැබීම පහසු වීම (18 වන වගන්තිය).
- සදෝෂ බීජ ගොවි ජනතාව වෙත ලබාදීම මත ඔවුන්ට සිදු වන පාඩුව වගකිවයුත්තන්ගෙන් අය කර ගැනීමට හැකිවනසේ ප්‍රතිපාදන ඇතුලත් කිරීම අවශ්‍ය වී තිබීම (20 වන වගන්තිය 6 උප වගන්තිය).

## නව යෝජනාවලියට අදාලව ජනමාධ්‍ය මඟින් ඉදිරිපත් කළ කරුණු හා අපගේ පැහැදිලි කිරීම්

### කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතියකින් තොරව බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය, ළඟ තබා ගැනීම, බෙදා හැරීම, හුවමාරු කිරීම, විකිණීම සපුරා තහනම් කර තිබේද?

එලෙස යෝජනා කර නොමැත. තවද, මෙම පනත වාණිජ ව්‍යාපාර අරමුණින් යුතු බීජ හා රෝපණ ද්‍රව්‍ය හසුරුවන්නන් සඳහා පමණක් අදාල වන සේ යෝජනා කර ඇත. එවැනි බීජ හා රෝපණ ද්‍රව්‍ය හසුරුවන්නන් පනත යටතේ ලියාපදිංචි වී ප්‍රමිතියකට අනුකූලව කටයුතු කළයුතු වේ (23 වන වගන්තිය). එයට හේතුව වනුයේ ප්‍රමිතියෙන් උසස් බීජ හා රෝපණ ද්‍රව්‍ය ගොවි ජනතාව වෙත ලබා දීම මෙම පනතේ මුඛ්‍ය පරමාර්ථය වන බැවිනි.

### බීජ පනත හේතුවෙන් දේශීය බීජ නැතිවී යා හැකිද?

දේශීය හෝ පාරම්පරික බීජ, සම්ප්‍රදායික ක්‍රම යටතේ නිෂ්පාදනය කිරීමට හෝ හුවමාරු කිරීමට කිසිදු බාධාවක් පමුණුවා නැත. තවද එම සම්ප්‍රදායික බීජ හා රෝපණ ද්‍රව්‍ය වාණිජමය ව්‍යාපාරයක් ලෙස වුවද නිෂ්පාදනය කර බෙදාහැරීමට ප්‍රතිපාදන ඇතුළත් කර ඇත. එවැනි අවස්ථාවලදී පමණක් බීජ පනත යටතේ ලියාපදිංචි වීම අවශ්‍ය වේ. ඒ අනුව දේශීය බීජ සුලභතාවය ඉහල යෑමක් අපේක්ෂා කළ හැක (10 වන වගන්තිය).

### කෘෂිකර්ම නිලධාරීන්ට පොලිස් බලතල ලබා දී ඇත්ද?

මෙම පනතේ අරමුණු ඉටුකර ගැනීමට යටත්ව කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා, අදාල අධ්‍යක්ෂවරයා, රෙජිස්ට්‍රාර්වරයා, සහකාර රෙජිස්ට්‍රාර්වරයා හා බලයලත් නිලධාරීන්ට පමණක් අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය යටතේ පොලිස් බලතල ලබා දීමට යෝජනා කර ඇත (4 වන වගන්තියේ 6 වන උප වගන්තිය). වෙනත් පනත් වලද (උදා: ආහාර පනත) මෙවැනි ප්‍රතිපාදන ලබා දී තිබේ (නීත්‍යානුකූලව කටයුතු කිරීමට බලයක් නොමැති නම් පනතේ අරමුණු කාර්යක්ෂමව ඉටුකර ගැනීමට අපහසු බැවින්).

### දේශීය ප්‍රභේද රැක ගැනීමට ගොවියාට තිබූ අයිතිය අහෝසි කර තිබේද?

දේශීය ආහාර බෝගයන් ගේ ජාන සම්පත් සුරැකීම පිළිබඳවූ ප්‍රතිපාදන, ප්‍රථම වතාවට දේශීය පනතක වගන්තියක් ලෙස මෙම යෝජනාවලියට ඇතුළත් කර ඇති අතර එය කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් ගේ ප්‍රධාන වගකීමක් ලෙස හඳුනාගෙන තිබේ. එහෙත් දේශීය හෝ සම්ප්‍රදායික දේශීය ප්‍රභේද රැක ගැනීමට, දේශීය ගොවි ජනතාවට තිබූ අයිතිය අහෝසි නොකිරීමට තීරණය කර ඇත. තවද, ජාන සම්පත් මතු පරපුර සඳහා රැක ගැනීම පිණිස ඒවා විදේශ සමඟ හුවමාරුව, ආනයන අපනයන සඳහා රීති හා මාර්ගෝපදේශ සකස් කිරීමට යෝජනා කර ඇත (18 වන වගන්තිය).

### බීජ සුරක්ෂිතතාවය නැති වී එමගින් ආහාර සුරක්ෂිතතාවයට බලපෑම් ඇති වේද?

ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය හසුරුවන්නන් දිරිමත් කර ඇත. (10 වන වගන්තිය 1 වන උප වගන්තිය) එමගින් ගුණාත්මක හා ප්‍රමිතියෙන් යුතු බීජ සුලභ වේ. එයින් දේශයේ ආහාර සුරක්ෂිතතාව තහවුරු වීමට හේතුවක් වනු ඇත.

### පවතින පනතට සංශෝධන ඉදිරිපත් නොකර නව පනතක් මඟින් බරපතල ප්‍රතිපාදන ඇතුලත් කර තිබේද?

පවතින 2003 බීජ පනතේ බීජ ආනයන, අපනයන, හැසිරවීමේදී ආදින් ද ඇතුළුව බීජ කර්මාන්තයේදී සිදුවන ගැටළු වලට විසඳුම් ලබාදීමට ප්‍රතිපාදන සලසා දී නොමැති නිසා නව පනත යටතේ නව යෝජනා ඉදිරිපත් කර ඇත. තවද කෘෂිකර්මාන්තයට වැදගත් වන්නාවූ දේශීය පාරම්පරික බෝගවල ජාන සම්පත් සුරක්ෂිත කිරීම තහවුරු වී නොමැති වීමද ඇතුළුව ඉහත 3-4 පිටුවල සඳහන් වු නව යෝජනා ඇතුලත් කිරීමට ද හැකිවීම සඳහා නව පනතක් ලෙස ඉදිරිපත් කර ඇත.

### බීජ හා රෝපණ ද්‍රව්‍ය වල හිඟයක් ඇති විය හැකිද?

ජාතික බීජ අවශ්‍යතාවයන් පුරෝකථනය කර, ඒ අනුව බීජ නිෂ්පාදනය සැලසුම් කර ක්‍රියාත්මක වීමට යෝජිත බැවින් බීජ හා රෝපණ ද්‍රව්‍ය වල හිඟයක් ඇති වීමට ඉඩකඩ අවම වේ.

### සහතික බීජ නිපදවීම සඳහා අනාගතයේදී බහු ජාතික සමාගමකින් මූලික බීජ ලබා ගැනීමට සිදුවේද?

ගුණාත්මක මූලික බීජ වලින් බීජ වගාවන් ආරම්භ කිරීම, ගුණාත්මක බීජ නිෂ්පාදනයට අත්‍යාවශ්‍ය වේ. ඒ නිසා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් නිර්දේශිත ප්‍රභේදයන් සඳහා පමණක්, එලෙස මූලික බීජ භාවිතා කිරීමට යෝජනා කර ඇත. එබැවින් බහු ජාතික සමාගම් මෙයට අදාළ නොවේ (17 වන වගන්තිය).

### ප්‍රමිතියට අනුකූල නැතැයි තහනම් කළ බීජ තොගයක් දින නියමයක් නැතිව මුද්‍රා තැබීමට කටයුතු කළ හැකිද?

මෙයට දින 14 ක උපරිමයක් ලබාදීම යටතේ සංශෝධනය කිරීමට නියමිතය (20 වන වගන්තියේ 8 උපවගන්තිය).

### යම්කිසි ගොවියෙකුට හෝ කුඩා පරිමාණ බීජ හසුරුවන්නෙකුට ලියාපදිංචිය ලබා දීම ප්‍රතික්ෂේප වූ විට ඔහුට බීජ විකිණීමට නොහැකි වේද?

අභියාචනා ඉදිරිපත් කර ලියාපදිංචිය ලබා ගැනීම හෝ නැවත ලියාපදිංචිය ලබාගැනීම සිදුකළ හැකිවේ. (12 වන වගන්තිය 2 වන උප වගන්තිය). දැනටමත් කුඩා පරිමාණ බීජ හසුරුවන්නන් විශාල සංඛ්‍යාවක් ලියාපදිංචිය ලබාගෙන ඇති අතර ඔවුන් බීජ කර්මාන්තයේ සාර්ථකව නියැලෙමින් පවති. මෙම යෝජනාවලිය යටතේ ද ඔවුනට එලෙස කටයුතු කල හැකි වේ.

### දෙමුහුම් බීජ සඳහා නිර්මාණය වී ඇති වෙළඳපොල මෙම පනත මඟින් ආරක්ෂා කෙරේද?

ප්‍රමිතියට පටහැනිව කටයුතු කිරීම වළක්වාලන අතරම, ප්‍රමිතියට අදාලව ක්‍රියා කරන බීජ හා රෝපණ ද්‍රව්‍ය හසුරුවන්නන්ගේ හා බීජ හා රෝපණ ද්‍රව්‍ය භාවිතා කරන්නන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම මෙම පනතේ අරමුණ බැවින් එක් කණ්ඩායමක් පමණක් ආරක්ෂා කිරීමට ප්‍රතිපාදන සලස්වා නොමැත.

### බීජ සහතික කිරීමේ සේවය සහතික කරනු නොලැබුවේ නම් කිසිදු සම්ප්‍රදායික බීජයක්, පැළයක්, හුවමාරු කිරීමට හෝ විකිණීමට නොහැකි වේද?

බීජ වගාවන් සහතික කර ගැනීම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීමේ සේවය මඟින් ඉටු කර ගැනීම හෝ බීජ හසුරුවන්නාට ඔහු විසින්ම නිර්දේශිත ප්‍රමිතීන්ට අනුකූලව බීජ වගාවන් නඩත්තු කර ප්‍රමිතිකරණය කර අලෙවියට ඉදිරිපත් කිරීමට අවස්ථාව නව බීජ හා රෝපණ ද්‍රව්‍ය පනත් යෝජනාවලියෙන් ලබා දී ඇත. (2003 අංක 22 දරණ පනතේ සඳහන් ආකාරයටම)

### නව යෝජනාවලිය වැඩිදියුණු කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග කවරේද?

මෙය පනත් කෙටුම්පතක් සඳහාවූ යෝජනාවලියක් පමණි. ඒනිසා මෙය දේශීය ගොවි ජනතාවගේ සුභසිද්ධිය පිණිස තවදුරටත් සංශෝධනය කිරීමට අවස්ථා පවති. එමනිසා, ගොවි ජනතාව හා අදාළ පාර්ශවයන් දැනුවත් කර ඔවුන් වෙතින් ලබාගන්නා යෝජනා හා අදහස් පහත ලිපිනයට නොපමාව යොමු කරන්න. ඒ තුළින් මෙම යෝජිත පනත් කෙටුම්පත ශ්‍රී ලංකාවට වඩාත් උචිත පරිදි වෙනස් කර ඉදිරිපත් කිරීමට අවස්ථාව එළඹෙනු ඇත.

වැඩි විස්තර සඳහා -:

*අධ්‍යක්ෂ (බී.ස.පැ.සං), බීජ සහතික කිරීම හා පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය, තැ.පෙ. 74, ගන්නොරුව, පේරාදෙණිය*

*TP: 081-2388044 / Fax: 081-2388077 / E-mail:* scppc@sltnet.lk

*බීජ පනත ක්‍රියාත්මක කිරීමේ අංශය TP: 081-3755235/ E-mail:* scsseedact@gmail.com

සැකසුම: චාමරි නිලූෂි සිල්වා, කෘෂිකර්ම උපදේශක (සන්නිවේදන)
අධීක්ෂණය හා උපදෙස්: ඩබ්.ඒ.පී. සිසිර කුමාර, අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන)